www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හෙගල්, මාක්ස්, එංගල්ස් සහ මාක්ස්වාදයේ සම්භවයන්

## ටොම් රොක්මෝර් විසින් රචිත මාක්ස්වාදයෙන් පසු මාක්ස්: කාල් මාක්ස්ගේ දර්ශනය යන කෘතිය පිලිබඳ විමර්ශනයක්

**Hegel, Marx, Engels, and the Origins of Marxism**
**A review of *Marx After Marxism: The Philosophy of Karl Marx* by Tom Rockmore**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2006 මැයි 02.**

*පහත පල කෙරෙන්නේ කොටස් දෙකකින් සමන්විත ලිපියක පලමුවන කොටස යි. දෙවන කොටස හෙට පල කෙරෙනු ඇත.*

*මාක්ස්වාදයෙන් පසු මාක්ස්: කාල් මාක්ස්ගේ දර්ශනය, [*Marx After Marxism: The Philosophy of Karl Marx*] ටොම් රොක්මෝර් විසිනි. පිටු 224යි. බ්ලැක්වෙල් ප්‍රකාශකයෝ, 2002. එක්සත් ජනපද ඩොලර් 29.95 යි.*

ඉලිනොයිස්හි ඩියුක්විස්නේ විශ්ව විද්‍යාලයේ දර්ශනවාදය පිලිබඳ දේශකයකු වන ටොම් රොක්මෝර්, *මාක්ස්වාදයෙන් පසු මාක්ස්: කාල් මාක්ස්ගේ දර්ශනය* නමැති තම කෘතිය අරඹන්නේ පහත සඳහන් ප්‍රකාශනය සමගිනි:

"ලිබරල් ධනවාදයට ඓතිහාසික විකල්පයක් ලෙස මාක්ස්වාදය දේශපාලන ප්‍රවිෂ්ටයක් වසයෙන් අසාර්ථක වී ඇති බව ඉබේටම පැහැදිලිය, නැත හොත් අඩුවසයෙන් පැහැදිලි විය යුතු ය. විසිවන ශතවර්ෂය තුල බොහෝ කාලයක් ප්‍රධාන බලපෑමක් ඇති කලා වූ සර්වාධිකාරී මාක්ස්වාදය හා ලිබරල් ධනවාදය අතර විරෝධය 1989 දී සිදු වූ සෝවියට් කඳවුරේ වේගවත් අභාවයෙන් හා 1991 දී සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව දිය වී ගියේ ය. එහි ප්‍රතිඵල වසයෙන් නවීන කාර්මික ලෝකය, ලිබරල් ආර්ථික හා ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම මත දැඩිව පදනම් වූ පැස්කලියානු පරදුතැබීමකට චේතනා රහිතව ම බැස ගති. මෙය ලියන මොහොත වන විට නූතන ආර්ථික ලිබරල්වාදයට එරෙහි සැබෑ ප්‍රතිමල්ලවයෙක් කාර්මිකකරනය වූ ලෝකය තුල වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ඇත්තේනැත." (xi) (මෙය නම් උවමනාවට වඩා ඉක්මනින් බැස ගත් නිගමනයකි!)

"දේශපාලනික මාක්ස්වාදයේ" මරනය පිලිබඳව රොක්මෝර් කරන නිවේදනය ශාස්ත්‍රාලිය ලෝකය තුල බල පවත්වන දෘෂ්ටිය පිලිබඳව දර්ශික මතුකල උදාහරනයකි.

එම දෘෂ්ටිය වනාහි සෝවියට් සංගමයේ අවසානය දරන්නා වූ අර්ථය නම් *මාක්ස්වාදයේ අවසානය* බවයි. එහෙත් මෙම අභ්‍යර්ථනයේ පදනම කුමක් ද? එය වනාහි පැරනි සෝවියට් නිලධරය මාක්ස්වාදය නියෝජනය කලේය යන අප්‍රකාශිත ප්‍රස්තුතයට වැඩි යමක් නො වේ. සත්තකින් ම මෙම ප්‍රස්තුතය මාක්ස්වාදය පිලිබඳව ට වඩා බෙහෙවින් යමක් වෘත්තිමය මහාචාර්ය සනුහරයේ සමාජ සහ දේශපාලන දෘෂ්ටිය පිලිබඳව කියා දෙයි. නිල බුද්ධිමතුන්, ක්‍රෙම්ලිනයේ ප්‍රතිගාමී ජාතිකවාදී දේශපාලනය සහ මාක්ස්වාදයේ විද්‍යාත්මක ලෝක දෘෂ්ටිය යන දෙකම එක යයි තහවුරු කර ගෙන ඇත්තේ මොන පදනමක් උඩ ද? ඔවුන් සාමාන්‍යයෙන් කරන්නේ මෙම ගැටලුව සරලව මුලුමනින්ම නො තකා හැරීමය. මෙම ශාස්ත්‍රඥයන්, විප්ලවීය මාක්ස්වාදීන් විසින් දශක ගනනාවක් පුරා ක්‍රෙම්ලින් කතිපයාධිකාරයට (ප්‍රභූ ස්ථරයට - පරිවර්තක) එරෙහිව දියත් කරනු ලැබූ සැබෑ දේශපාලන අරගලය දෙස තම අකනිටාවල සිට අවලෝකනය කරන්නේ රාජකාරි කර බැඳි මහාචාර්යවරුන්ගේ කාලය මිඩංගු කිරීමට තරම් නොවටනා "කන්ඩායමික දබරයන්" ලෙස ය. අවම වසයෙන් 1991 දක්වා ක්‍රෙම්ලින් නිලධරයේ බලය යථා ව පැවැත්තේ යයි පිලිගැනීමට මෙම මහාචාර්යවරුන්ට සෑහුනි. වෙනත් වචනවලින් කියතොත්: බලගතු රාජ්‍යයන් පාලනය කල නිලධරය සැලකිය යුතු ප්‍රදානයන් බෙදා ලීමට හැකියාව දරා සිටියේ ය. - මේවායින් කොටසක් විලාසිතාවන් යයි වාමශාස්ත්‍රඥයින් සහභාගි වීමට ප්‍රියකල ජාත්‍යන්තර සම්මන්ත්‍රන සාදවලට මුදල් යෙදවීමට භාවිතා කරනු ලැබිනි, සඳහා නිරත වීමේ හැකියාව ද තිබුනි.

1920 ගනන්වල අග භාගයේ පටන් - එනම් ලියොන් ට්‍රොට්ස්කි හා වාම විපාර්ශ්වය තුල සිටි ඔහුගේ සහායකයන් සෝවියට් කොමියුනිස්ට් පක්ෂයෙන් නිල වසයෙන් නෙරපනු ලැබූ තැන් පටන් විප්ලවවාදී සමාජවාදී වැඩපිලිවෙලේ හා භාවිතයේ න්‍යායික පදනම වසයෙන් ගත් කල්හි මාක්ස්වාදය සෝවියට්

තන්ත්‍රයේ ප්‍රතිපත්ති තුල කිසිදු භූමිකාවක් ඉටු කලේ නැත. ක්‍රෙම්ලිනය සෝවියට් තන්ත්‍රයේ මාක්ස්වාදී ප්‍රභවයන් අහෝසි කිරීමට හෝ 1930 ගනන්වල දී සෝවියට් සංගමය තුල මාක්ස්වාදී හා විප්ලවවාදී බුද්ධිමත් ස්ථරයේ ඉතුරුව පැවති සුන්බුන්වලට ද කම්කරු පන්තියට ද එරෙහිව දියත් කරන ලද දේශපාලනික සංහාරය තුලින් ලේවැකි ප්‍රකාශනයක් අත් කර ගති. ස්ටැලින් ද ක්‍රෙම්ලිනයේ ඔහුගේ සහචරයන් ද විසින් මෙහෙයවුනු ජාත්‍යන්තර ප්‍රතිවිප්ලවයේ තියුනු හී තුඩ වූයේ විප්ලවීය සමාජවාදීන් සිය දහස් ගනනක් මරා දැමූ මොස්කව් හොර නඩු හා ඒ හා සම්බන්ධ විරේකයන් ය.

1933 තරම් ඈත දී, ස්ටැලින්වාදීන් හිට්ලර්ට බලය අල්ලාගැනීමට මග පාදමින් ජර්මානු කම්කරු පන්තිය පාවාදුන් කල ට්‍රොට්ස්කි දේශපාලන විප්ලවයක් මගින් ක්‍රෙම්ලින් නිලධරය පෙරලා දැමිය යුතු යැයි කැඳවුම් කලේ ය. ට්‍රොට්ස්කිට වැදගත් වූයේ පලිගැනීම නොව, සෝවියට් සංගමය ආරක්ෂා කර ගැනීම යි. ඔහුගේ නිරන්තරව අනතුරු ඇඟවූයේ කම්කරු පන්තිය නිලධරය පෙරලා නොදැමුව හොත් ස්ටැලින්වාදී තන්ත්‍රයේ පිලිවෙත් සෝවියට් සංගමයේ බිඳ වැටීමට මග පාදනු ඇති බවටයි. ස්ටැලින්වාදය අර්බුද ග්‍රස්ත තන්ත්‍රයක් යයි ද, ක්‍රෙම්ලින් නිලධරයේ ජාතිකවාදී වැඩපිලිවෙල ආර්ථික වසයෙන් මෙන් ම දේශපාලනිකව ද බංකොලොත් යයි ද, ධනවාදය ආධිපත්‍යය දරන ලෝක ආර්ථිකයේ පීඩනයන් ගෙන් සෝවියට් සංගමය දීර්ඝ කාලීනව ආරක්ෂා කිරීමට නිලධරයේ දේශසීමිත ආර්ථික පිලිවෙත් සමත් නොවේ යයි ද සෝවියට් සංගමයේ ඉරනම බටහිර යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ දියුනු ධනපති රටවල සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනය මත රඳා පවතී යයි ද ට්‍රොට්ස්කි කල අවධාරනය හතර වන ජාත්‍යන්තරයේ මාක්ස්වාදී ක්‍රියාමාර්ගයේ අත්‍යවශ්‍ය සංරචකයන් විය.

1991 දී සෝවියට් සංගමය බිඳවැටීම සැබැවින් ම නියෝජනය කලේ හතරවන ජාත්‍යන්තරය ද එපමනක් නොව දේශපාලන ඉදිරිදර්ශනයේ විද්‍යාවක් ලෙස මාක්ස්වාදයේ ද බේදානීය සනාථනයයි. තමන් සමාජ විද්‍යාවන්හි කෙලපැමිනියවුන් යයි කියාගන්නා - බොහෝ සෙයින් සෝවියට් සංගමය එක් රැයකින් අතුරුදහන් වෙතැයි කවර ලෙසකින් හෝ පරිකල්පනය කලේවත් නැති - පන්ඩිතයන් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය දිගට ම දරාගෙන සිටි මාක්ස්වාදී විශ්ලේෂනය අත්‍යසාමාන්‍යව දූරදර්ශී වී යයි අඩු ගනනේ පිලිගත යුතුව තිබුනි.

එහෙත් බුද්ධිමය නිහතමානයේ එවන් ප්‍රකාශනයන් නම් දක්නට ලැබුනේ නැත. ඒ වෙනුවට සිද්ධ වූයේ සෝවියට් සංගමයේ අවසානය කියාපාන්නේ මාක්ස්වාදයේ මරනය නිවේදනය කරන ප්‍රකාශන කන්දරාවක් එල් බැස්සීමට ය. මේ ජාතියේ ප්‍රකාශන පුලුල් වසයෙන් වර්ග දෙකකට අයත් විය. මින් පලමු ගනයට අයත්වූයේ, සෝවියට් සංගමයේ අවසානය සරලව ම පවත්නා ධනේශ්වර පර්යායට එරෙහි මොනම විකල්පයක් හෝ නොපැවැත්තේ යයි සරලවම තහවුරු කරන බව කියා සිටි (ෆුකුයාමා හා පයිප්ස් වැන්නවුන් අයත්) දේශපාලනිකව දක්ෂිනාංශයෙන් නිපන් ධනවාදයේ නග්න දෘෂ්ටිවාදාත්මක ආරක්ෂකයන්ගේ නිර්මානයන් ය. දෙවන වර්ගයට අයත්වන්නේ ඈත අනාගතයේ අවිනිශ්චිත මොහොතක සමාජමය වෙනසක හැකියාව තවමත් පිලිගන්නා එහෙත් එවන් අනාගත සමාජ පරිවර්තනයන් සඳහා න්‍යායික මූලද්‍රව්‍යය සම්පාදනය කරන්නේ මාක්ස්වාදය නොවේ යයි අවධාරනය කරන වාමානුගත විද්වතුන් ගෙන් පහල වූ පලල් කෘති මාලාවකි.

## මාක්ස්වාදයට එරෙහිව ව්‍යාජ-හෙගල්වාදය

එසේ නම් මාක්ස්වාදයට විකල්පය කුමක් ද? පූර්ව-මාක්සියානු දර්ශනවාදයේ හා දේශපාලනයේ විවිධ රූපාකාර පුනර්ජීවනය කල යුතු යයි තර්ක කරන නව විද්වත් සාහිත්‍ය කෘතීන් සම්භාරයක් පවතී. ඉන් කියා සිටින්නේ 1840 ගනන්වල දී මාක්ස් නම් තරුන ආචාර්යවරයාගේ ඉස්මතුවීම, විකල්ප වාම ප්‍රගතිශීලී දර්ශනයන් හා සමාජ ව්‍යාපාරයන්වල වර්ධනය ගබ්සා කල බවකි. හෙගල් වියැකීයන ලෙස විවේචනය කිරීම මත මාක්ස්ගේ කටයුතු වර්ධනය වූ හෙයින් මාක්ස්ගේ එම ප්‍රහාරය මගින් කරන ලද විනාශය ප්‍රතිසංස්කරනය කල යුතු යයි තර්ක කරනු ලැබේ. මෙම කෘතිවල තර්කනය වනාහි මාක්ස් විසින් දෙපයින් සිටුවන ලද පැරනි විඥානවාදී දර්ශනවාදියා (හෙගල් - පරිවර්තක) යලි ඔලුවෙන් සිටුවීම අවශ්‍ය බවයි. වර්තමාන සන්දර්භය තුල ප්‍රගතිශීලී සමාජ න්‍යායක් හා භාවිතාවක් සඳහා ප්‍රමානවත් පදනමක් හෙගල්ගේ කෘති විසින් සම්පාදනය කෙරෙතැයි මෙම ලේඛකයෝ තර්ක කරති. මෙම ආකාරයට තර්ක කරන කෘතීන්ගෙන් සමහරක් විශදව ම මාක්ස්ට හතුරු ය; අනෙක් ඒවා යෝජනා කරන්නේ එක්කෝ මාක්ස් හෙගල්ගේ චින්තනයට එකතු කලේ ඉතා සුලුවෙන් බව ය; නැතහොත් මාක්ස් තමන්ගේ ම සියත් බව අතිශයෝක්තියට නංවා ගත් බවයි. තවත් සමහරෙක් පෙනී සිටින්නේ හෙගල්වාදය හා මාක්ස්වාදය බද්ධ කිරීමට යි, ඒ ද පොදුවේ මාක්ස්වාදයට හානි වන අයුරිනි.

හෙගල්ගේ සාරාත්මය [1] (*Spirit of Hegel,* නිව් ජර්සි, 1992) නම් තම කෘතිය තුල මහාචාර්ය එරල් හැරිස් ලියන්නේ, "ඔලුවෙන් සිටගෙන සිටින්නේ හෙගල් නොව, හිස සුන් අපෝහකයේ කවන්ධයට තවමත් ජීවයක් හා චලනයක් ඇතැයි පරිකල්පනය කරන මාක්ස් හා එංගල්ස් ය."[2] ඔහු මෙසේ ද කියයි. "මාක්ස්ගේ ම ධර්මයන් නොතැකිය යුතුයයි කිසිවෙකුත් නො කියනු ඇත. එහෙත් හෙගල්ගේ විඥානවාදය පිලිබඳ සාහසික දුරවබෝධයක් මත පදනම් වූ නිසා හෙගල් පිලිබඳ

මාක්ස්ගේ විවේචන බෙහෝවිට අත්‍යසාමන්‍යව ම මුග්ධ ය; පටු හා ඒකපාක්ෂික ය."

*නිදහස පිලිබඳ හෙගල්ගේ දර්ශනය* (*Hegel's Philosophy of Freedom,* නිව් හෙවන් සහ ලන්ඩන්, 1999) නම් කෘතිය තුල මහාචාර්ය පෝල් ෆ්රැන්කෝ තර්ක කරන්නේ වර්තමාන ලෝකයේ ගැටලුවලට පිලිතුරු සොයා ගනු ඇත්තේ මාක්ස්ගෙන් නොව හෙගල් තුලින් බවයිඃ "පසු ගිය වසර තිහක් තරම් කාලය ඇතුලත, හෙගල්ගේ සමාජ හා දේශපාලන දර්ශනය පිලිබඳ උනන්දුව දැවැන්ත පුනර්ජීවයක් අත් කර ගෙන තිබේ. මුලදී මාක්ස්ගේ වත්‍යපෘතියේ සම්භවයන් සොයා යාම මගින් විශාල වසයෙන් ප්‍රේරනය කරනු ලැබූ මෙම පුනර්ජීවය ස්වසන්තකයෙන්ම චින්තකයකු පමනක් නොව ඉදිරිපත් කිරීමට මාක්ස්ටත් වඩා ප්‍රගාඪ යමක් ඇති අයෙකු ලෙස හෙගල් වෙතට අභිසාරනයක් අරඹා ඇත." (පිටුව ix) පසුව ෆ්රැන්කෝ මාක්ස් පිලිබඳව සඳහන් කරන්නේ හෙගල්ගේ "අපගතයකු" (77) ලෙසයි.

කැනේඩියානු විද්වතෙකු වන ඩේවිඩ් මැක්ග්‍රෙගර්, ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජීය වසයෙන් ප්‍රගතිශීලී ව්‍යාපෘතීන් පදනම් වී ගත යුතු ප්‍රධාන න්‍යායික අත්තිවාරම ලෙස හෙගල්වාදය තහවුරු කිරීමට යෙදවුනු කෘතීන් ගනනාවක් ම ලියා ඇත. හෙගල් හා මාක්ස් තුල කොමියුනිස්ට්වාදී පරමාදර්ශය (*The Communist Ideal in Hegel and Marx,* ටොරන්ටෝ සහ බෆලෝ, 1990) නම් කෘතිය තුල මැක්ග්‍රෙගර් පහත සඳහන් දෑ අවධාරනය කරයි. " හෙගල්ගේ රාජ්‍යය පිලිබඳ න්‍යායට එරෙහිව මාක්ස් පිහිටුවාලූ, හෙගලියානු පරමාදර්ශය පිලිබඳ මාක්ස්ගේ සාවද්‍ය අර්ථකථනය, ඔහුගේ පසු කාලීන අනුගාමිකයින් (මොවුන්ට හෙගල්ගෙන් ඉගෙනීමට බොහෝ දේ ඇත) විසින් වර්තමානයේ දී පමනක් මුහුන දී පොර බැදීමට ප්‍රයත්න දරනු ලබන අද්‍යතන ලිබරල් ප්‍රජාතාන්ත්‍රික යථාර්ථය බැරෑරුම්ලෙස (එකල්හි ම) ග්‍රහනය කර ගැනීමෙන් මාක්ස්ව වලක්වන්නට ඇත. මේ කෘතිය පෙන්නුම් කරන්නේ හෙගල්ගේ දේශපාලන න්‍යායේ අන්තර් ඥානයන් හා සමග මාක්ස්ගේ විවේචනය පන්නරය ගන්වන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය පිලිබඳ අවබෝධයකි." (3-4). තම අරමුන වනාහි "මාක්ස් විසින් එය මත පටවනු ලැබූ අර්ථකථනයෙන් හෙගල්ගේ චින්තනය මුදා ගැනීමය" යි මැක් ග්‍රෙගර් අවෘතව සඳහන් කරයි. "ගුඪවාදී කටුව තුල හේතුධාරී හරය සොයා ගැනීම සඳහා හෙගලියානු අපෝහකය කනපිට හැරවිය යුතුව තිබිනැයි මාක්ස් කල ප්‍රකාශයට එරෙහිව මම තර්ක කරන්නෙමි."

පසුව පල කල තම හෙගල්, මාක්ස් හා ඉංග්‍රීසි රාජ්‍යය (*Hegel, Marx and the English State,* ටොරන්ටෝ, බෆලෝ සහ ලන්ඩන්, 1992) නම් කෘතිය තුල මාක්ස් පිලිබඳ තම විවේචනය මැක්ග්‍රෙගර් තව දුරටත් විස්තාරනය කරයි. ඔහු මාක්ස්ට මතු කියැවෙන පරිදි චෝදනා කරයි. "ඔහු (මාක්ස්) හෙගලියානු උරුමයේ වැදගත් අංශයකට වැරදි ලෙස අත ගැසීය. ඔහු ශ්‍රමයේ නිෂ්පාදිතයට කම්කරුවාට ඇති අයිතිය අඩංගු කර ගත් හෙගල්ගේ පෞද්ගලික දේපොල පිලිබඳ සංකල්පය, අතිරික්ත වටිනාකම නමැති මතිය හා කොමියුනිස්ට්වාදය යටතේ පෞද්ගලික දේපොල නිශේධනය වීම යන්නෙන් විස්ථාපනය කලේ ය. මෙහි අර්ථය වූයේ මාක්ස්ගේ පරමාදර්ශී සමාජය රාජ්‍යයකින් පමනක් නොව, තව දුරටත් පුද්ගලික නිදහස තහවුරු කිරීමටත් ආධිපත්‍යධාරී ප්‍රභූ තන්ත්‍රය විසින් අත්තනෝමතිකව පාලනය කරනු ලැබීම වැලැක්වීමටත් අවශ්‍ය සිවිල් සමාජීය ආයතන බොහොමයකින් ද තොර වූ බවය."

කොමියුනිස්ට්වාදයේ බිඳ වැටීමෙන් පසු හෙගල් සහ මාක්ස් ( *Hegel and Marx After the Fall of Communism,* කාඩිෆ්, 1998) නම් තවත් කෘතියක් තුල දී හෙගල්-මාක්ස් සම්බන්ධය පිලිබඳව මනාව ස්ථාපිත මාක්සියානු සංකල්පය පිලිබඳ මැක්ග්‍රෙගර්ගේ විවේචනයේ සමාජ දේශපාලනික සාරය වඩාත් පැහැදිලිව ඉස්මත්තට එයිඃ "පෞද්ගලික දේපොල සංකල්පය, හෙගල් හා මාක්ස් අතර සම්බන්ධයේ විවාදාත්මක කේන්ද්‍ර ස්ථානය සකස් කරයි.... පුද්ගලික දේපොල සංස්ථාව ආරක්ෂා කිරීමට හෙගල් කැපවූ අතර මාක්ස් අවධාරනය කලේ එය පෙරලා දැමීම යි. ...ධනේශ්වර දේපොල පිලිබඳ මාක්ස්ගේ විවේචනය සමග හෙගල් ද එකඟ වනු ඇතැයි මම අදහස් කරමි. එහෙත් හෙගල් මෙන් දේපොල අයිතියේ ධනාත්මක පාර්ශ්වය කෙරෙහි සංවේදී වීමට මාක්ස් අසමත් වියඃ ඒ වෙනුවට ඔහු යෝජනා කලේ නිෂ්පාදන මාධ්‍යයන්හි පොදු අයිතිය සඳහා දේපොල සබඳතා අහෝසි කිරීමටයි." (116-118). මැක්ග්‍රෙගර්ට අනුව, මාක්ස්ගේ විප්ලවීය සමාජවාදී අභිලාෂයන්ට බුද්ධිමය අභිනිවේෂයක් සඳහා වූ ස්වශක්ත විකල්පයක් හෙගල්ගේ දේශපාලන න්‍යාය මගින් සම්පාදනය කෙරේ. එනම් සාඩම්බර හා ජනහිතකාමී නිලධරයක් විසින් සාරගර්භ සමාජ වෙලඳපොල පද්ධතියක් මෙහෙයවනු ලබන ලිබරල් සුභසාධන රාජ්‍යය යලි පනගන්වා ගැනීම යි.

මහාචාර්ය වෝරන් බ්‍රෙක්මන්ගේ මාක්ස්, තරුන හෙගල්වාදීන් හා රැඩිකල් සමාජ න්‍යායේ_සම්භවයන් ( *Marx, the Young Hegelians, and the Origins of Radical Social Theory,* කේම්බ්‍රිජ්, 1999) නමැති කෘතිය ද මීට සමාන ආකාරයකට තර්ක කරයි. මොහු කියා සිටින්නේ සෝවියට් සංගමයේ ද එයට අනුබද්ධව තිබූ නැගෙනහිර යුරෝපීය තන්ත්‍රයන්ගේ ද බිඳ වැටීමේ ප්‍රතිඵලය වී ඇත්තේ ධනවාදයට හා ධනේශ්වර "සිවිල් සමාජයට" මාක්ස්දැක්වූ අශමනීය විරුද්ධත්වය විද්වත් සමාජ න්‍යායවේදීන් අතර අපකීර්තියට පත් වූ බවයි. "

ඒකගත්වයට පත්වන තනි ප්‍රධාන ක්ෂේත්‍රය වන්නේ සිවිල් සමාජ පිලිබඳ සංකල්පය පරිපූර්නව බැහැරකිරීමේ කාල් මාක්ස්ගේ ආස්ථානය සංකීර්න සමාජයන් තුල ප්‍රජාතාන්ත්‍රික ජීවිතය වර්ධනය කිරීමට ප්‍රමානවත් නොවන බවයි" යන්නය. මෙහිලා නව්‍ය වන්නේ මෙම අන්තර්ඥානය නොව ඒ පිලිබඳ පොදු සම්මුතිය ය. " සමාජවාදය පිලිබඳ යම් අදහසකට සහානුභූති වූ ධනවාදය පිලිබඳ මාක්ස්වාදී විවේචනයක කොටස්කරුවන් ලෙස රැඳී සිටින හෝ අවම වසයෙන් 'මාක්ස්වාදයේ නිශ්චිත පරමාදර්ශයකින් ආවේශය ලබන්න" යයි කියන ජැක් ඩෙරිඩා වැනි අය පවා සිවිල් සමාජය පිලිබඳ මාක්ස්ගේ විවේචනයේ අඩු ලුහුඬුකම් විවෘතව පිලිගනිති" යයි ද (2) "වර්තමාන විවාදය මාක්ස්වාදයෙන් ඔබ්බට යාම අවශ්‍යය යන්න පිලිගන්නේ නම්, එහි ප්‍රධාන විලක්ෂනීය පියවරක් වී ඇත්තේ ආවේෂය හා න්‍යායික මාර්ගෝපදේශනය සඳහා මාක්ස්ට පෙර සමය වෙත ඇස් යොමු කිරීම යි ද (පූර්ව) මාක්සියානු සමාජ න්‍යාය කෙරෙහි ඇති මෙම පශ්චාත්-මාක්ස්වාදී උනන්දුව විසින් තරුන මාක්ස් විජයග්‍රාහීව අතික්‍රමනය කලේ යයි කියා සිටි ශ්‍රේෂ්ට චින්තකයා වූ හෙගල්ගේ අපේක්ෂාවන් හා අදාලත්වය අර්ථභාරී ලෙස උද්දීපනය කර ඇත." (3) යනුවෙන් ද බ්‍රෙක්මන් සඳහන් කරයි.

එහි අභිප්‍රේරනය දේශපාලනිකව හා බුද්ධිමය වසයෙන් ඉහත දැක්වුනු තරම්මැ සැක කටයුතු නොවේ නම් හෙගල් පිලිබඳ උනන්දුව යලි පනගැන්වී ඒම නිශ්චිතව ම යහපත් වර්ධනයකි. එහෙත්, යුරෝපයේ සිදු වූ යෝධ සමාජ-ආර්ථික පරිවර්තනයන්ගෙන් මෙන් ම 1831 දී හෙගල්ගේ මරනයෙන් පසුව ඇති වූ තීරනාත්මක විද්‍යාත්මක ප්‍රගමනයන් තුලින් ඓතිහාසිකව පැන නැගුනු මාක්ස් හා එංගල්ස් විසින් පසුකාලීනව ඇති කරන ලද බුද්ධිමය වර්ධනය පිලිබඳව සඳහන් නොකර (හෝ වැරදි අර්ථ කථනයකින්) හෙගල් හෝ 1840ට පෙර ජර්මානු සම්භාව්‍ය විඥානවාදී ලෝකයේ වෙනත් ප්‍රධාන පුද්ගලයෙකු මත පදනම් ව සමාජ හා දේශපාලන න්‍යායක් වර්ධනය කිරීමට දරන ප්‍රයත්නය වනාහි න්‍යායික හා බුද්ධිමය වසයෙන් ප්‍රධාන පසු පියවරක් නියෝජනය කරන අතර එවැන්නකට සේවය කල හැක්කේ ප්‍රතිගාමී දේශපාලන අරමුනුවලට ම පමනි.

## ඓතිහාසික මුසාකරනය හා දුෂ්අර්ථ නියෝජනය

ඉහත උපුටා දක්වන ලද කෘතීන් මෙන්ම රොක්මෝර්ගේ කෘතිය ද රැඩිකල් සමාජ පරිවර්තනයක් සඳහා නව න්‍යාය පත්‍රයක් සොයා ගැනීම මාක්ස්වාදයේ න්‍යායික බලපෑම නිෂ්ප්‍රභ කිරීම මගින් කල යුතුව ඇතැයි යෝජනා කරයි. එහෙත් රොක්මෝර්ගේ ප්‍රවිෂ්ටය අනෙක්වාට වඩා තරමක් වෙනස් ය. අනෙකුත් කෘතීන් හෙගල්ව මාක්ස්ගේ ග්‍රහනයෙන් මුදා ගත යුතු යයි යෝජනා කරන අතර රොක්මෝර් තර්ක කරන්නේ මාක්ස්වාදයේ දෘෂ්ටිවාදාත්මක සිරබන්ධනයන්ගෙන් නිදහස් කර ගත යුතුව ඇත්තේ මාක්ස්ම බවය. සැබෑ මාක්ස් භක්තිමත් හෙගලියානු විඥානවාදියෙකු වූ බව රොක්මෝර් නිවේදනය කරයි. මාක්ස් භෞතිකවාදියෙක් වූ බවට සාර්වත්‍රිකවම පාහේ පවත්නා පිලිගැනීම වනාහි රොක්මෝර්ගේ තර්කයට අනුව නම් අන් කිසිවක් නොව බැරෑරුම් න්‍යායික කාර්යභාරයක් උදෙසා අත්‍යාවශ්‍ය විශ්වවිද්‍යාල පුහුනුව නොමැති හෙයින් දාර්ශනික අගුටු මිට්ටෙකු වූ ෆෙඩ්රික් එංගල්ස් නමැත්තා විසින් මාක්ස්ගේ සැබෑ චින්තනයේ අඩංගු සමස්ත හෙගලියානු සූක්ෂමතා ඉවත්කර මාක්ස්වාදය යනුවෙන් හැඳින්වෙන දෘෂ්ටිවාදාත්මක මූර්ගත්වය නිර්මානය කිරීම මගින් කරන ලද විකට රූපී මුසාකරනයක හා වංචාකාරී අපරාධයක විපාකය යි!

රොක්මෝර්ට අනුව "එංගල්ස්ගෙන් නිෂ්පන්න වන මාක්ස්වාදය වනාහි හෙගල් බැහැරකල මාක්ස් කෙනෙකු පිලිබඳ දෘෂ්ටියක් නිර්නය කිරීම වෙනුවෙන් හෙගල්ගේ සිට මාක්ස් දක්වා වූ සබඳතාව පිලිබඳ එය (එම මාක්ස්වාදය) විසින් ම කරනු ලැබ ඇති අර්ථකථනය මත අනුභ්‍රමනයවන්නකි. මාක්ස් පිලිබඳ මාක්ස්වාදී දෘෂ්ටිය හරයෙන්ම සාවද්‍ය බවත් එය ඔහුගේ (මාක්ස්ගේ) දාර්ශනික ප්‍රතිපදානය ද ඇතුලත් මාක්ස්ගේ ආස්ථානය පිලිබඳ වඩා හොඳ දැක්මකට බාධා කරන බවත් මගේ විශ්වාසය යි. මාක්ස් 'යලි ප්‍රකෘතිමත් කර ගැනීම' සඳහා හැකිතාක් දුරට අප ඔහුව මාක්ස්වාදයෙන් එහෙයින් ප්‍රථම මාක්ස්වාදියා වූ එංගල්ස්ගෙන් මුදා ගැනීම අවශ්‍යයයි මම තර්ක කරන්නෙමි." (1) යි රොක්මෝර් ලියයි.

එංගල්ස් හා මාක්ස් අතර වෙනස්කම් පැවතුනු බවට තර්ක කරන ප්‍රථමයා රොක්මෝර් නොවේ. ජෝර්ජ් ලූකෑෂ්, ලුෂියෝ කොලේටි, ෂෝන් හයිපොලයිට්, ජෝර්ජ් ලිඩ්හයිම්, ෆ්‍රැන්ක් ෆර්ට් ගුරුකුලයේ විවිධ නියෝජිතයන් හා ඉතා මෑතක දී ලෙසෙක් කොලකොව්ස්කි වැනි නානාවිධ ලේඛකයන් විසින් විවිධ කාලවකවානුවලදී මෙම අදහස ඉදිරිපත් කර ඇත. මාක්ස් මිය ගොස් වසර 12කට පසුව ද එංගල්ස් ජීවත්ව සිටියේ ය යන හුදු කාරනය ම, පසු රැකුන තැනැත්තේ, තම අභාවප්‍රාප්ත සහකරුවාගේ දෘෂ්ටීන් තුලට තමාගේම අදහස ආදේශ කිරීම සඳහා ඔහුගේ ලේඛන බූදලයේ පොල්මෘකාරයා ලෙස තමන්ට පැවති තැන ගසා කෑවේ යයි කරන අභ්‍යර්තනයට ප්‍රමානවත් වී ඇත. මාක්ස්ගේ හා එංගල්ස්ගේ දෘෂ්ටීන් අතර පවත්නේ යයි කියනු ලබන වෙනස්කම් වර්තමානය වන විට දේව පුරානයක තත්වයට පත්ව ඇත. ඉහත සඳහන් ලේඛකයන් විසින් ඉදිරිපත් කොට ඇති ප්‍රකාශ එකක්වත් බැරෑරුම් විශ්ලේශනයකට තරම් නොවන අතර ලූකාෂ් මෙම ගැටලුව පිලිබඳ තම ආස්ථානය

පසුව වෙනස් කරගත්තේය. එහෙත් ඔවුන්ගේ තර්ක විතර්කවලට යමෙක් කෙසේ විරුද්ධවුවත් මාක්ස්, එංගල්ස් හා හෙගල්ගේ කෘතිවලට අවශ්‍ය බුද්ධිමය බැරෑරුම් භාවයෙන් යුතුව ඔවුන් ප්‍රවිෂ්ට වූ බව පිලිගත යුතුව ඇත. එහෙත් රොක්මෝර් සම්බන්ධයෙන් නම් එවැන්නක් කිව නොහැකි ය.

මෙම කෘතිය පුරාම පැතිරී ඇති නොසැලකිලිමත් කමේ හා නරුමත්වයේ පොදු තානය සිය නෛසර්ගික ප්‍රකාශනය ලබාගත්තේ මාක්ස් හා එංගල්ස්ගේ ජීවිතකාලීන සහකාරිත්වයේ පදනම මත ඔවුන් දෙදෙනා පොදු දාර්ශනික හා න්‍යායික දෘෂ්ටියක පිහිටා සිටියේ යයි පිලිගන්නා අයට 'පිලිතුරු දීමට' රොක්මෝර් දරන ප්‍රයත්නය තුල ය.

"මාක්ස් හා එංගල්ස් එක් පොදු දෘෂ්ටියක සහකතුවරුන්වූ බව විශ්වාස කිරීමට ප්‍රධාන හේතුව පවත්නේ පලමුවැන්නා දෙවැන්නා සමග පැවති සමීප සන්ථවය තුල ය. මෙය හරියට දිගටම එකට එල්බී සිටිනා පුද්ගලයන් සිතනවා ඇත්තේ ද එකම ආකාරයකට යයි නිගමනය කිරීමට තරමක් සමානය යි රොක්මෝර් ලියයි. (8)

"එකට එල්බී සිටීම"? මෙය වනාහි ඩියුක්විස්නේ විශ්වවිද්‍යාලයේ දර්ශනවිද්‍යා අංශයේ තම සගයන් සමග මහාචාර්ය රොක්මෝර් කටයුතු කරන ආකාරය පිලිබඳව නම් ඉතා හොඳ විග්‍රහයක් විය හැකි ය. එහෙත් මාක්ස් හා එංගල්ස් අතර පැවති සබඳතාව පිලිබඳව විස්තර කිරීමට නම් මෙය කිසිසේත්ම උචිත ක්‍රමයක් නොවේ. ඔවුන් දෙදෙනා අතර පැවති සමීප බුද්ධිමය හා දේශපාලනික සහක්‍රියාකාරිත්වය 1844 සිට මාක්ස්ගේ මරනය සිදු වූ 1883 දක්වා වසර 39ක් පුරා විහිද තිබේ. එම කාලය තුල ලිපි හුවමාරු කරගැනීම හෝ පුද්ගලික හමුවීම් මගින් මොවුහු එකිනෙකා සමග සෘජු සබඳතා දෛනිකව ම යයි කිවහැකි තරමට ම පවත්වා ගත්හ.

*මාක්ස් එංගල්ස් සංගෘහිත කෘතිවල* වර්තමාන සංස්කරනයෙන් වෙලුම් 10ක් ම (මේ සෑම එකක්ම පිටු 500-600 අතර ප්‍රමානයකින් යුක්ත වේ) දෙදෙනා අතර ලිපි හුවමාරු සඳහා වෙන් වී ඇත. දශක හතරක් පුරා පැවති මෙම අත්‍යසාමාන්‍ය මිනිසුන් දෙදෙනාගේ බුද්ධිමය වර්ධනය හා අන්තර් ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීමට ඉඩ සලසන මෙම ලිපි යමෙකුට ඉතිහාසය තුල අසමසමවූ දාර්ශනික සහයෝගීතාවයේ, සදාචාරාත්මක ඥාතිත්වයේ හා පුද්ගලික මිත්‍රත්වයේ පරිමාව පිලිබඳව සාක්ෂ්‍ය දරයි. න්‍යායික දේශපාලනික හෝ පුද්ගලික කරුනු පිලිබඳව මොවුන් අතර නොඑකඟතාවන් මතුවූ සෑම අවස්ථාවක්ම පිලිබඳ ලේඛනගත වාර්තාවක් පවතී.

මාක්ස්වාදයේ තීරනාත්මක දාර්ශනික මූලාරම්භයන්ගේ කෘතිතුල විශේෂයෙන්ම ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පය ප්‍රථම වරට සවිස්තරාත්මකව විස්තාරනය කෙරුනු ජර්මානු දෘෂ්ටිවාදය (*The German Ideology*) - ඒකාබද්ධ කතෘත්වයට අමතරව මාක්ස් තමන් දෙදෙනාගේ පොදු න්‍යායික ලෝක දෘෂ්ටිය විස්තාරනය කිරීමේ දී එංගල්ස් ඉටු කල භූමිකාව පිලිබඳ ලිඛිත විස්තරයක් සම්පාදනය කලේ ය. ජර්මානු විඥානවාදය කෙරෙහි මාක්ස්ගේ නොනස්නා අවනතභාවය ආවරනය කල දුෂ්ට හෙගල් විරෝධියෙකු ලෙස එංගල්ස් හුවාදැක්වීමට රොක්මෝර් දරන ප්‍රයත්නය, මාක්ස් විසින්ම 1859 දී දේශපාලන අර්ථ ශාස්ත්‍රයට විවේචනයක් (*A Critique of Political Economy* ) නම් කෘතියට ලියූ හැඳින්වීම තුල, මේ කාරනය අරභයාම කියා ඇති දෙයින් පුපුරුවා හරිනු ලබයි.

"ෆෙඩ්රික් එංගල්ස් ආර්ථික ප්‍රවර්ගයන් විවේචනය පිලිබඳ තම දීප්තිමත් රචනය ( *Deutsch-Französische Jahrbücher* , ජර්මානු-ප්‍රන්ස වාර්ෂික ලිපි තුල) ප්‍රකාශයට පත් කල තැන් පටන් මා ඔහු සමග අඛන්ඩ අදහස් හුවමාරු කර ගැනීමක යෙදී සිටි අතර, ඔහු ද මා පැමිනි නිගමනවලට ම වෙනත් මාර්ගයකින් පැමිනියේ ය. (ඔහුගේ එංගලන්තයේ කම්කරු පන්තියේ තත්වය (*Condition of the Working Class in England* සසඳන්න). තවද 1845 වසන්තයේ දී ඔහු ද බ්‍රසල්ස්හි වාසය කිරීමට පැමිනි කල ඇත්ත වසයෙන්ම අපගේම පැරනි දාර්ශනික හෘදය සාක්ෂිය සමග ගනුදෙනු බේරාගැනීම සඳහා ජර්මානු දර්ශනවාදයේ දෘෂ්ටියට එරෙහිව අපගේ සංකල්ප පැහැදිලි කිරීමට අපි තීරනය කලෙමු. මෙම අභිප්‍රාය ක්‍රියාවට දමනු ලැබුවේ පශ්චාත් හෙගලියානු දර්ශනය පිලිබඳ විවේචනයක රූපාකාරයෙනි. වෙනස් වූ තත්වයන් යටතේ මුද්‍රනය කල නොහැකි යයි අපට දැනුම් දෙන අවස්ථාව වනවිට විශාල ඔක්ටේවෝ වෙලුම් දෙකකින් සමන්විත අත් පිටපත වන ජර්මානු දෘෂ්ටිවාදය වෙස්ට්ෆේලියාහි ප්‍රකාශකයන් වෙත ලගාවී බොහෝ කල් ගතවී තිබුනි. (ඉන් අප අපේක්ෂා කල) අපගේ ප්‍රධාන අරමුන -- ස්වයං-පැහැදිලිකමය පෙහෙලිකරගැන්ම -- කරා අප දෙදෙනාම ලගා වී තිබුනු හෙයින් කැමැත්තෙන්ම මීයන්ගේ ලැටිගෑම නමැති විවේචනයට එම අත් පිටපත අත්හැර දැමුවෙමු. එම කාලයේ දී අපගේ දෘෂ්ටීන්හි එක් හෝ තවත් අංශයක් මහජනතාව වෙත ප්‍රකාශයට පත්කල බොහෝ කෘතීන් අතරින් එංගල්ස් හා මම සහයෝගීව ලියූ *කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය* හා මා විසින් ම ප්‍රකාශයට පත් කල නිදහස් වෙලඳාම පිලිබඳ ගැටලුවේ කථාව ( *Speech on the Question of Free Trade*) පමනක් මම සඳහන් කරන්නෙමි. අපගේ සංකල්පයේ කැපී පෙනෙන අංශයන් ප්‍රථමයෙන් විවාදයක සවරූපයෙන් වුවත් ශාස්ත්‍රීය රූපයකින් සාරාංශගත කරනු ලැබුනේ මාගේ දර්ශනවාදයේ දුගීබව නැමැති කෘතිය තුලයි." *Collected Works*, Volume 29, New

York, 1987, p. 264 එකතු කල කෘති, වෙලුම 29, නිව් යෝර්ක්, 1987, 264 පිට).

හුදෙක් එක් ඡේදයක් තුලදී ම "මා පැමිනි එම නිගමනවලට ම ", "අපගේ සංකල්පය", "අපගේ පැරනි දාර්ශනික හෘදය සාක්ෂිය", "අපගේ ප්‍රධාන අරමුන - ස්වයං පැහැදිලිකම", "අපගේ දෘෂ්ටීන්" සහ අවසාන වසයෙන් "අපගේ සංකල්පයේ කැපී පෙනෙන අංශ" යනුවෙන් මාක්ස් විසින් සඳහන් කරනු ලැබීම ඔහු සහ එංගල්ස් අතර පැවති න්‍යායික එකඟතාවේ ඉතා උසස් මට්ටම පැහැදිලිව තහවුරු කරයි.

දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳ විවේචනයට මාක්ස් ලියූ හැඳින්වීම පිලිබඳව රොක්මෝර් සඳහන් කරන නමුත් ඔහු නොවේ ඉහත දක්වුන තීරනාත්මක ඡේදය උපුටා දක්වන්නේ. මාක්ස්ගේ ප්‍රකාශනයන් මගින් තමාගේම ප්‍රවාදය බන්ධනය කෙරෙන අවස්ථාවලදී රොක්මෝර් නිර්ලජ්ජිත බුද්ධිමය වංචනිකත්වයක් ප්‍රදර්ශනය කරමින් මාක්ස්ගේ අදාල ප්‍රකාශ නොතකා හරින එකම අවස්ථාව මෙය නො වන බව අපි තහවුරු කරන්නෙමු.

එංගල්ස් අපකීර්තියට පත්කිරීමට දරන තම අනවරත ප්‍රයත්නයේ දී රොක්මෝර්, මාක්ස්ගේ යාවජීව ජීවිතකාලීන සහකරුවා වූ මෙම පුද්ගලයා, මාක්ස් නිරවද්‍ය ලෙස අවබෝධ කර ගැනීමට අවශ්‍ය අධ්‍යාපන මට්ටමින් තොර වී යයි අවධාරනය කර සිටියි. එංගල්ස් යනු හුදෙක්

"දාර්ශනික සූක්ෂමතාවයන් කෙරෙහි සැලකිල්ලක් නො තිබූ" හුදු ස්වයංඅධ්‍යාපිතයෙකි." (9). "මාක්ස් දර්ශනය හැදෑරූ අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයෙන් පිරිනැමෙන ආචාර්ය උපාධියක් ද දිනා ගත්තේ ය. එහෙත් එංගල්ස් විශ්වවිද්‍යාල උපාධියක් ලැබුවෙක් නොවේ. දාර්ශනික නිපුනතාවය ගැන සඳහන් කිරීම පසෙක තැබූවත් තමාගේම උසස් ගනයේ දාර්ශනික වැඩ කටයුතු කිරීමට අත්‍යාවශ්‍ය පුහුනුව නොමැත්තෙකු වූ ඔහු දර්ශනවාදය උගත්තේ එහෙන් මෙහෙන් ය. මාක්ස්ගේ දාර්ශනික සිද්ධාන්ත හා ඍජු දාර්ශනික නිර්මානශීලීත්වය පිලිබඳ විදග්ධ අවබෝධයක් ද ඔහුට නොතිබුනි. දාර්ශනිකයෙකු ලෙස ඔහු පිලිබඳව කිවයුත්තේ විෂය පිලිබඳව උනන්දුවක් තිබූ දක්ෂ ආධුනිකයෙකුට වැඩි තැනැත්තෙක් නො වීය යන්නයි. " යනුවෙන් රොක්මෝර් තම පාඨකයන්ට මතක් කර දෙයි (10).

විද්වත් මහන්තත්වයේ සහ ගර්ව ප්‍රදර්ශක ස්වයංතෘප්තියේ කෙතරම් නම් අප්‍රසන්න ගැලතීමක් ද! මහාචාර්ය රොක්මෝර් විද්වත් සහතික පත්‍ර මත පැහැදිලිවම ලොකු බරක් තබන නමුත් දාර්ශනික චින්තනයේ ඉතිහාසය මත පදනම් ව බැරෑරුම් දාර්ශනික කාර්යයේ යෙදීමට ඇති කෞශල්‍යය ද විශ්වවිද්‍යාලීය දර්ශනවිද්‍යා අංශයක සුරක්ෂිත අසුනක් දරා සිටීම තබා විශ්ව විද්‍යාල ආචාර්ය උපාධියක් හිමිකරගෙන සිටීම අතර කුමනහෝ සහ සම්බන්ධයක් ඇති බව තහවුරු කිරීම අමාරු වනු ඇත. බැරෑරුම් දාර්ශනිකයකුවීමට සුදුස්සා කවරෙකුදැයි නිගමනය කිරීමට රොක්මෝර්ගේ ප්‍රමිතීන් පදනම් කර ගනු ලැබුව හොත්, බටහිර චින්තන ඉතිහාසයෙන් ඉවත් කිරීමට සිදු වන්නේ තරමක් සුප්‍රකට නම් අතරින් කිහිපදෙනෙකු නම් නොවේ. ස්පිනෝසා හා ඩේකාට්ගේ නම් ද මෙයට ඇතුලත් වේ. කාටීසියානු හේතුවාදයේ ආරම්භකයා පිලිබඳ තම මහගු නව ජීවන චරිතාපදානයේ දී ඩෙස්මන්ඩ් එම්. ක්ලාර්ක් අපට කියා ඇති පරිදි "පටු පන්ඩිතමානී ස්වභාවයක් දරන ඩේකාට්ගේ විධිමත් අධ්‍යාපනය, ඔහු අන්තිමේදී අත ගැසූ මානව ඥානය පිලිබඳ අති මූලික ප්‍රතිසංස්කරනයට පදනමක් සහතිකෙන්ම නිර්මානය කලේ නැත." (ඩේකාට් ජීවන චරිතාපදානයක්, *Descartes: A Biography,* කේම්බ්‍රිජ්, 2006, 37පි.) තවද "ස්වයං අධ්‍යාපිත" යන රොක්මෝර්ගේ පොදුවේ අභිප්‍රාය අපහාසාත්මක වන අතර එමගින් යමෙකුට පෙනී යනු ඇත්තේ ඉතිහාසයේ එන බොහෝ ශ්‍රේෂ්ඨ චින්තකයන් හා ලේඛකයන් එම ප්‍රවර්ගයට ඇතුලත් වනු ඇති බවයි.

කෙසේ වුවද විශේෂයෙන්ම දර්ශනවාදය පිලිබඳව, එංගල්ස්ගේ දැනුමේ පරිමාව හා ගැඹුර සඳහන් නොකලත්, ඔහුගේ බුද්ධිමය අදාලත්වය ගැන රොක්මෝර්ගේ ඉදිරිපත් කිරීම සහමුලින්ම සාවද්‍යය. මා අනුමාන කිරීමක අන්තරායට මුහුන දෙමින් වුව ද සඳහන් කල යුත්තේ , මහාචාර්ය රොක්මෝර්ට තමාගේ ආචාර්ය උපාධි අපේක්ෂකයන් අතර කලාතුරකින් අභිමුඛවන තරමේ අධ්‍යාපන මට්ටමකට එංගල්ස් එල්බර්ෆෙල්ඩ්හි උසස් පාඨශාලාවේ සිය අධ්‍යාපන කටයුතු සම්පූර්න කල කාලය වන විට, එලඹ තිබූ බවයි. 1837 සැප්තැම්බරයේ ඉදිරිපත් කල (මේ වන විට එංගල්ස්ගේ වයස අවුරුදු 17ක් වත් නොවේ.) ඔහුගේ පාසල් වාර්තාවට අනුව, ඔහුගේ ලතින් භාෂා නිපුනත්වය කොතෙක්දැයි කිවහොත් "දීර්ඝ පාඨවල සම්බන්ධතාව තේරුම් ගැනීම, අදහස්වල ගලායාම ග්‍රහනය කර ගැනීම හා තමන් ඉදිරියේ ඇති පාඨ ග්‍රන්ථය දක්ෂ ලෙස මවු බසට පරිවර්තනය කිරීම පහසුවෙන් කල හැකිවන පරිදි, නම් වසයෙන් සඳහන් කලහොත් ලිවියස් සහ සිසේරෝ, වර්ජිල් හා හොරේස් වැනි ගද්‍ය හෝ පද්‍ය ලේඛකයන් අනුක්‍රමිකව තේරුම් ගැනීමට ඔහුට කිසිදු අපහසුවක් නොවී ය." ඔහුගේ ග්‍රීක භාෂා ඥානය පිලිබඳව සඳහන් කරන එම වාර්තාව "වචන නිර්මානය හා වාක්‍ය සංයෝජනය හා ව්‍යාකරනය පිලිබඳ සතුටුදායක දැනුමක් ඇති, පහසු ග්‍රීක ගද්‍ය රචකයන් මෙන් ම හෝමර් හා යුරිපිඩීස් ද පිලිබඳ විශේෂඥ නිපුනත්වයක් හා ඔවුන්ගේ කෘති පරිවර්තනය කිරීමේ හැකියාවක් ඇති එංගල්ස්ට ප්ලතෝනික සංවාදයක අදහස් ගලා යන ආකාරය ග්‍රහනය කර ගැනීමේ හා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත." තවද මෙම පාසල් වාර්තාවේ රචකයා ගනිතය, භෞතික විද්‍යාව, හා

දාර්ශනික ප්‍රාරම්භයන් (philosophical propaedutic) පිලිබඳ එංගල්ස්ගේ අවබෝධය ප්‍රශංසාවට ලක් කරයි. (එකතු කල කෘති 2 වෙලුම නිව් යෝර්ක් 1975. පිටු 584-85)

දර්ශනවාදය පිලිබඳ ක්ෂේත්‍රය තුල බැරෑරුම් වැඩ කටයුත්තකට අත ගැසීම සඳහා අවශ්‍ය පුහුනුව හෝ නිපුනත්වය එංගල්ස්ට නොතිබුනේ යයි කියාපෑමේ අසච්ච මත රැඳී පවත්නා කෘතියක් වන මෙහි, මාක්ස් ප්‍රථමයෙන් මුන ගැසීමටත් පෙර එංගල්ස්ට ජර්මානු බුද්ධිජීවී කවයන් තුල ප්‍රමුඛ තැනැත්තෙකු ලෙස ඔහුව තහවුරු කලා වූ ඔහුගේ ජීවිතයේ මූලික අවධිය තුල වූ සිදු වීම් එනම් සිදුවීම - එනම් එංගල්ස් විසින් ෆෙඩ්රික් ෂෙලිංව ඛන්ඩනය කිරීම - පිලිබඳ කිසිවක් රොක්මෝර් විසින් සඳහන් නො කිරීම සිත් කම්පා කරවයි. රැඩිකල් -ප්‍රජාතන්ත්‍රවාදී ශිෂ්‍යයන් අතර හෙගල්වාදයේ බලපෑම ව්‍යර්ථ කිරීම ට 1841 දී බර්ලිනය වෙත කැඳවනු ලැබූ අවධිය වනවිට වයස්ගත දාර්ශනිකයකු ව සිටි ෂෙලිං, ප්‍රශියාවේ අගනුවරට පැමිනීම ආන්දෝලනයක් ඇති කලේ ය. ප්‍රමුඛ දාර්ශනික සිද්ධියක් ලෙස සලකනු ලැබූ ඔහුගේ දේශනවලට පැමිනි බොහෝ අය අතර තරුන කියකගාඩ්, බකුනින් හා එංගල්ස් ද වූහ. තම තරුන වියේ දී හෙගල් සමග එක්ව නවාතැන්ගෙන සිටියා වූද, එක් කාලයකදී ඔහු තමන්ගේ සමීපතම මිත්‍රයන්ගෙන් කෙනෙකු හැටියට සැලකුවා වූ ද ෂෙලිං, හෙගල්ගේ වෛෂයික විඥානවාදී පද්ධතිය ප්‍රතික්ෂේප කොට දාර්ශනික ආත්මීයවාදය හා අහේතුකවාදය දෙසට තියුනු හැරීමක් ගත්තේ ය. තවද එහෙත් ජර්මානු දර්ශනවාදයේ ප්‍රමුඛ පුද්ගලයා ලෙස හෙගල් ඉස්මතු වූ විට ෂෙලිංගේ පැරනි කීර්තිය යටපත් විය. එහෙත් 1831 දී සිදු වූ හෙගල් ගේ අභාවයෙන් පසුව, පැරනි දාර්ශනිකයාගේ කෘතිවලින් ශිෂ්‍යයන් උකහා ගන්නා විප්ලවීය නිගමනයන්ගෙන් ප්‍රුසියානු රාජ්‍ය බලධාරීන් නිරන්තර කරදරයට පත් කෙරුනි. රැඩිකල් හෙගලියානු විනිවිදයාමේ පැතිරීම වැලැක්වීමේ කර්තව්‍යය ෂෙලිං වෙත පවරා දෙනු ලැබිනි.

හෙගල්වාදයේ කීර්තිය හා උරුමය ආරක්ෂා කිරීමේ අරගලය තුල ඉස්මතු වූ ප්‍රමුඛ චරිතය වූයේ අන් කිසිවකු නොව එංගල්ස් ය. 1841 දී එංගල්ස් විසින් ලියන ලද ෂෙලිං සහ අනාවරනය, හෙගල් පිලිබඳව ෂෙලිං, හා ෂෙලිං ක්‍රිස්තුස් තුල දාර්ශනිකයා, යන කෘතීන් තුන හෙගලියානු ආස්ථානයකින් ෂෙලිංව තීරනාත්මක ලෙස ඛන්ඩනය කිරීමක් ලෙස වාම හෙගල්වාදී ශිෂ්‍යයන් විසින් පිලිගනු ලැබුනි. රොක්මෝර් මෙම කෘති නොතකා හැරීම තුලින් - "එංගල්ස්, දර්ශනය ගැන හෝ හෙගල් පිලිබඳව නිරවද්‍ය ලෙස දැන නොසිටියේ ය." (162) යන ඔහුගේ ප්‍රකාශයේ විකාර සහගත බව වහාම හෙලිදරව් වේ. එය බුද්ධිමය වංක භාවයකට වඩා කිසිසේත් අඩු නොවේ. රොක්මෝර් සරලවම කරන්නේ තම හැල්ලු ප්‍රවාදවලට වලකපන සිද්ධීන් හා කෘති නොතකා හැරීම හෝ ඒවා ලිස්සා හැරීමයි.

එංගල්ස්, විද්‍යාව මගින් දර්ශනවාදයට සම්පූර්නයෙන් ම අවලංගු කරනු ලැබ, එහි මුලුමහත් බුද්ධිමය වලංගුභාවය අහෝසි කරගෙන තිබුනු බව ඒත්තු ගෙන සිටි "යථානුභූතිවාදියකු" වී යයි රොක්මෝර් නැවත නැවතත් අවධාරනය කරයි.

රොක්මෝර්ට අනුව එංගල්ස් "හෙගල්ට සලකන්නේ හෙගල්ගේ දර්ශනවාදය ප්‍රාග්-විද්‍යාත්මක අභූතයක් ලෙස ගනිමිනි. (15) අත්‍යන්තයෙන්ම සාහසික වන එවැනි කෲර ව්‍යාජ ප්‍රකාශයන් කියවන කෙනෙකුට හැඟී යනු ඇත්තේ පවත්නා ප්‍රති මාක්ස්වාදී දේශපාලනික හා බුද්ධිමය ප්‍රතිගාමිත්වයේ පරිසරය තුල, වියත්බවේ සකල පිලිගත් ප්‍රමිතීන් නොකතා හැරීමට තමන්ට නිදහස ඇතැයි රොක්මෝර් විශ්වාස කරන බවකි. කිසියම් සුවිශේෂ ප්‍රකාශයක්, සත්‍ය ද අසත්‍ය ද යන්න හෝ ලිඛිත කෘති හා ඓතිහාසික වාර්තා මත පදනම්ව එය තහවුරු කල හැකි ද යන්න මෙහි දී කිසිදු වැදගත් කමක් නැත්තක් සේ ය. ඔහු පොරබදන්නේ බුද්ධිමය ප්‍රත්‍යක්ෂභාවය හා න්‍යායික නිරවද්‍යභාවය සඳහා නොව පූර්ව කල්පිත දෘෂ්ටිවාදාත්මක න්‍යාය පත්‍රයක් සපුරාගැනීම පිනිසයි.

එංගල්ස් "ඔහුගේ සමයේ ජීවත්වූ විශිෂ්ඨතම විශ්වකෝෂී මනස පැවති පුද්ගලයා" ( collected works, vol 25, New York, 1987, p.25) ලෙස ස්මරනීයව විස්තර කල හා හෙගල්ගේ සුධීමත් භාවයට, ප්‍රසංශා කල අවස්ථා උපුටා දක්වමින් පිටු දුසිම් ගනනක් වුව පුරවා ලීම අපහසු නොවේ. එංගල්ස්ගේ හෙගල් ප්‍රසංශනය එය උච්චතම උද්වේගී ප්‍රකාශනය අත් කරගත්තේ *ලුඩ්විග් ෆොයාබාක් සහ සම්භාව්‍ය ජර්මානු දර්ශනවාදයේ අවසානය* නමැති ඔහුගේ විශිෂ්ට පොත් පිංච තුලයි. එහි දී ඔහු හෙගල් "වර්තමානයේ පවා විශ්මය දනවන ඥාන සම්භාරයක්" ඉදිරිපත් කල " ඔලිම්පියානු සියුස් දෙවියකු" ලෙස හඳුන්වයි. එම චින්තා සම්භාරයට ඇතුලත් වූ දේ අතර "මනස පිලිබඳ ප්‍රපංච විද්‍යාව තර්කශාස්ත්‍රය ස්වභාවධර්මය පිලිබඳ දර්ශනවාදය, මනස පිලිබඳ දර්ශනවාදය, විවිධ ඓතිහාසික උප බෙදුම් මගින් විස්තාරනය කරන ලද මනස පිලිබඳ අධ්‍යයනය, ඉතිහාසය නීතිය, ආගම පිිබලිඳ දර්ශනවාදය, දර්ශනවාදයේ ඉතිහාසය, සෞන්දර්ය විද්‍යාව යන මේ සියලු විවිධ ඓතිහාසික ක්ෂේත්‍රයන්හි වර්ධනයේ මූලික හුයපට සොයා හෙලිපෙහෙලි කිරීමට හේගල් මහත්සේ ප්‍රයත්න දැරුවේ ය.

මෙකී ශාස්ත්‍රයන් අතරින් මනස පිලිබඳ ප්‍රපංච විද්‍යාව මනසේ ආරම්භයත් අතීතයත් පිලිබඳ විද්‍යාවන්ට එනම් මනසේ කලල විද්‍යාව හා කාලනීර්න විද්‍යාව (පැරනි ඇටකටු පරීක්ෂා කිරීම මගින්) සමාන්තරයක්

යැයි කිව හැකි ය. මනසේ අතීතය , පුද්ගල විඤ්ඤානය විවිධ අවස්ථා තුලින් විකාශනය වීමේ ඓතිහාසික ගමන් මාර්ගයේ දී මිනිසාගේ විඤ්ඤානය විසින් පසු කර ගෙන ආ අවධීන් සැකෙවින් ප්‍රතිනිෂ්පාදනය කිරීම තුලින් ප්‍රකාශිත වෙයි.) හේගල් නිර්මානාත්මක සුබුද්ධිමතෙකු පමනක් නොව විශ්වකෝෂයක් වැනි පඬිවරයෙක් ද විය. එහෙයින් ඔහු සෑම ක්ෂේත්‍රයක් තුල ම නව යුගයකට මුල පුරන ක්‍රියා කලාපයක් ඉටු කෙලේ ය. "පද්ධතියේ" අවශ්‍යතාවන් නිසා බොහෝ විට ඔහුට දූක සේ ගැට ගැසූ ප්‍රකාශයන් නිර්මානය කිරීමට සිදු වූ බව ඒ ප්‍රකාශයන්ගෙන් ම පැහැදිලි වේ. ඔහු අභියස අඟුටුමිට්ටන් බඳු විරුද්ධවාදීහු ඒ ප්‍රකාශයන් ගැන අද ද මහත් සේ ඝෝෂා කරති. එහෙත් මේ ප්‍රකාශ වනාහි ඔහුගේ කෘතියෙහි හුදු රාමුව හා පලංචිය යි. අනවශ්‍ය ලෙස එතැන රස්තියාදු නො වී දැවැන්ත ගොඩනැගිල්ලේ අභ්‍යන්තරය කරා නොනැවතී ඉදිරියට ගිය හොත් අසංඛ්‍ය වූ නිධානයෝ හමු වෙති. ඒවායේ අගය අද ද නොනැසී පවතී. සියලු ම දර්ශනවාදීන්ගේ කෘතිවල නැසී යන දෙයක් ඇත් නම් ඒ "පද්ධතිය" යි. මක් නිසාද යත්, එය සකලවිධ ප්‍රතිවිරෝධයන් ඉක්මවීමට මිනිස් මනසේ ඇති නො නැසෙන උවමනාවෙන් මතු වන නිසා ය." ꞉*Marx-Engels Collected Works*, සංගෘහිත කෘති, 26 වෙලුම, මොස්කව්, 1990, පි. 361-62.)

මෙය ද ගිනිය නොහැකි තරම් වන එංගල්ස්ගේ කර්තෘත්වයෙන් යුත් තවත් උද්ධෘතයන් ද පවත්නා තතු තුල හෙගල්ගේ වැඩ කටයුතු "ප්‍රාග්-විද්‍යාත්මක විකාරයක්" ලෙස බැහැර කලේය යි ප්‍රකාශ කිරීම සඳහා රොක්මෝර්ට අවසර ලැබී ඇත්තේ කෙසේ ද? ඔහුගේ මෙම කයෝ්ර මුසාකරනයන් මගින් සිය සංස්කාරකවරුන් හෝ කාර්ය සාධනය පවත්වාගෙන යන විද්වත් ප්‍රජාව අතර මෙ මගින් තැවුලක් ඇති නො කරන්නේ යයි රොක්මෝර් උපකල්පනය කරනු ලබනවා විය යුතු ය. මාක්ස්වාදය ගැන ලියැවෙන කෘතිවල ශාස්ත්‍රීය දෘඪතරභාවයක් අපේක්ෂා නොකරනවාක් මෙන් ය. මොවුන් අතර පවත්නා ආදර්ශ පාඨය වන්නේ, "ඕනෑ ම දෙයක් ඔට්ටු ය" යන්න යි.

එංගල්ස් වනාහි විද්‍යාවේ වර්ධනය විසින් දර්ශනවාදය අනවශ්‍ය බවට පත් කර තිබේ ය යන්න දරා සිටි යථානුභූතිවාදියෙකු වීය යන රොක්මෝර්ගේ අවධාරනයේ සාවද්‍යභාවය ද ඊට නොඅඩු ය. ඇත්ත වසයෙන්ම එංගල්ස් ලියා තැබුවේ ඊට මුලුමනින්ම ප්‍රතිවිරුද්ධ දෙයකි. දර්ශනවාදයේ වර්ධනය තුල ප්‍රකාශනය අත්පත් කර ගන්නා මානව චින්තන සංකල්පයන්හි ඉතිහාසය පිලිබඳ බැරෑරුම් දැනුමක් නොමැති වීම මගින් අතිශයින්ම දීප්තිමත් ස්වභාව විද්‍යාඥයන්ගේ වැඩ කටයුතු පවා සීමාවන බවට එංගල්ස් නිරන්තරයෙන් අනතුරු ඇඟවී ය. ආනුභවික පර්යේශනයක ප්‍රතිඵල නිවැරදිව අර්ථකථනය කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය සංකල්පමය චින්තන "කලාව" අත්කර ගත හැක්කේ දර්ශනවාදයේ ඉතිහාසය පිලිබඳව කරන වෙහෙසකර අධ්‍යයනයක් තුලින් පමනක් බව එංගල්ස් අවධාරනය කලේය. එක් වැදගත් ඡේදයක එංගල්ස් ලියූ පරිදි: "ආනුභවික ස්වභාව විද්‍යාව ඥානනය සඳහා කොතරම් නම් දැවැන්ත සාධනීය ද්‍රව්‍යමය දත්ත සම්භාරයක් සංගෘහිත කර ගෙන ඇත්දැයි කිව හොත්, සෑම වෙන් වෙන් විමර්ශන ක්ෂේත්‍රයක් තුල ම ක්‍රමවත්ව හා අභ්‍යන්තර අන්තර් සබඳතාවලට අනුකූල වන පරිදි ඒවා වර්ග කිරීම පරම විධානයක් බවට පත්ව තිබේ. ඥානයේ විවිධ වූ අංශයන් එකිනෙක සමග නිරවද්‍ය සම්බන්ධතාවයකට පැමිනවීම ද එවැනි ම විධානයක් බවට පත්වෙමින් තිබේ. කෙසේ වුවද එසේ කිරීමේ දී ස්වභාව විද්‍යාව න්‍යායේ ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වන අතර මෙහිදී නම් යථානුභූතවාදයේ විධික්‍රම වැඩ කරනු නැත. එයට ආධාරක විය හැක්කේ න්‍යායික චින්තනයට ම පමනි. එහෙත් න්‍යායික චින්තනය සහජ ගුනයක් වන්නේ එම චින්තනය ස්වභාවික ශක්‍යතාවය ලෙස ගැනීමෙන් පමනි. එම ස්වභාවික ශක්‍යතාවය වර්ධනය කල යුතු ය. දියුනු කල යුතු ය. එය එසේ වර්ධනය කරගත හැකි එකම මාර්ගය වන්නේ පූර්වප්‍රාප්ත දර්ශනවාදයන් අධ්‍යයනය කිරීම මගින් මිස අන් ලෙසකින් නො වේ. ( *collected works*, සංගෘහිත කෘති, 25 වෙලුම, 338 පිට)

දර්ශනවාදයේ අදාලත්වය පිලිබඳ එංගල්ස්ගේ සංකල්පනය, රොක්මෝර් ඔහුට ආරෝපනය කිරීමට තැත් කරන දෙයෙහි පරිපූර්න ප්‍රතිවිරුද්ධය බව තහවුරු කරන එංගල්ස්ගේ තවත් ඡේදයක් මෙහි දී උපුටා දැක්වීමෙන් වැලකීමට මා අසමත් ය. "දර්ශනවාදය නොතකා හැරීම හෝ හෙලා දැකීම මගින් තමන්ට දර්ශනවාදයෙන් ගැලවී ගත හැකි යයි ස්වභාවික විද්‍යාඥයෝ විශ්වාස කරති. එහෙත් චින්තනයෙන් තොරව ඉදිරියට යාමට ඔවුන්ට කිසි සේත් ම නොහැකි වන අතර චින්තනය සඳහා චින්තනයේ නිර්නයන් ග්‍රහනය කර ගැනීම අවශ්‍යවේ. එහෙත් ඔවුන් ප්‍රත්‍යවේක්ෂනයකින් තොරව ම චින්තන ප්‍රවර්ග අල්ලා ගන්නේ එක්කෝ, බොහෝ කලකට පෙර ම අභාවයට පත් දර්ශනයන්ගේ නටබුන්වල ආධිපත්‍යයට යටත් ඊනියා උගතුන්ගේ පොදු විඥානයෙනි. නැතහොත් විශ්වවිද්‍යාලය තුල අනිවාර්යයෙන්ම ඇසීමට නියමිත කැබැලිති වූ පමනක් නොව විවිධාකාර වූද පොදුවේ නරකම වූද ගුරුකුලවලට අයත් පුද්ගලයන්ගේ මතාන්තර ජංජාලයකිනි, එසේත් නැත හොත් සියලු වර්ගවල දාර්ශනික කෘතීන් අවිචේචනාත්මකව හා අපිලිවෙලට කියවීමෙනි. එහෙයින් ඔවුහු නොඅඩුවම දර්ශනවාදයට බන්ධනගතව පවතින්නාහ. එහෙත් අවාසනාව නම්, ඔවුන් බොහෝ දෙනෙක් බැඳී සිටින්නේ නරකම දර්ශනවාදයට ය; එමතු ද නොව, දර්ශනවාදය වැඩියෙන්ම අපයෝජනය කරනුයේ හරියට ම නරකම දර්ශනවාදයන්හි වඩාත්ම ග්‍රාම්‍යකරනය වූ

නෂ්ඨාවශේෂයන්ගේ වහලුන් බවට පත්වූ මිනිසුන් ය." (සංගෘහිත කෘති, 25 වෙලුම, පිටු. 490-91)

එතරම්මැ පැහැදිලිව පෙනෙන දෑ එංගල්ස්ගේ ලේඛනයන්හි මේසා පරිමාන පෘථුල වාර්තාවක් තිබිය දී, එතරම් ම දිදුලන ලෙස සාවද්‍යවූ ලිඛිත ප්‍රකාශයන් කිරීමට රොක්මෝර්ට හැකිවූයේ කෙසේ දැයි පාඨකයා දන් තමාගෙන්ම අසාගනු ඇත. පිලිතුරනම් "ඕනෑම දෙයක් ඔට්ටුයි කියන වෘත්තීය විද්වත් ප්‍රතිමාක්ස්වාදයේ ලෝකයට සාදරයෙන් පිලිගනිමු!" යන්නයි.

**මතු සම්බන්ධයි.**